සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

45 | S | I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

12 ශ්‍රේණිය
Grade 12

බෞද්ධ ශිෂ්ටාචාරය - I
Buddhist Civilization - I

පැය දෙකයි
Two hours

සැලකිය යුතුයි :

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ අංකය ලියන්න.**
- **උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.**

* **01 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර** තෝරාගෙන එය **උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

(01) බුදුරජාණන් වහන්සේ භාරතයෙහි පහළ වන විට නිර්මාණවාදය පදනම් කරගත් බමුණු දහම ව්‍යාප්තව පැවතියේ ය. එමගින් බ්‍රාහ්මණ ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශූද්‍ර යනුවෙන් සමාජ වර්ගීකරණයක් හඳුන්වා දුන්නේ ය. එය හඳුන්වනු ලබන්නේ,

1. හේතුඵල ධර්මය නමිනි.
2. වර්ණ ධර්මය නමිනි.
3. ස්වධර්මය නමිනි.
4. ආශ්‍රම ධර්මය නමිනි.
5. අපද්ධර්ම නමිනි.

(02) බ්‍රාහ්මණ ඉගැන්වීම් අනුව ලොව සියල්ල සිදුවන්නේ මහා බ්‍රහ්මයාගේ කැමැත්ත අනුවය. එම මතය අනුව විශ්වය නිර්මාණය කරන ලද යන අර්ථයෙන් මහා බ්‍රහ්මයා හඳුන්වා ඇත්තේ,

1. විශ්ව කර්තෘ නමිනි.
2. සර්වඥ නමිනි
3. සර්ව දර්ශී නමිනි.
4. සර්ව බලධාරී නමිනි
5. සර්වතෝ භද්‍ර නමිනි.

(03) චතුර් වර්ණයට අයත් ස්වධර්ම පරීක්ෂා කිරීමේ දී පැහැදිලි වන්නේ ඒ ඒ වර්ණයන්ට සුවිශේෂී කාර්ය භාරයන් ද පැවති බවයි. ඒ අනුව වෛශ්‍ය වර්ණයට පමණක් සුවිශේෂී වූ කාර්යයන් දෙකක් වනුයේ,

1. ඉගෙනීම හා දන්දීමයි.
2. යාග කිරීම හා වේදය ඉගැන්වීමයි
3. වේද අධ්‍යයනය හා දන් පිළිගැනීමයි.
4. ප්‍රජා පාලනය හා යාග කිරීමයි.
5. කෘෂි කර්මාන්තය හා පශු පාලනයයි.

(04) යාගයක් සිදු කිරීමේ දී බ්‍රාහ්මණ පූජකවරුන්ගේ සහභාගී වීම අත්‍යවශ්‍ය විය. ඒ අතර ''හෝතෘ'' නමින් හඳුන්වන ලද පූජකවරයාට පවරන ලද්දේ,

1. යාගය සඳහා දෙවියන්ට ආරාධනා කිරීමයි.
2. යාගයේ අධ්‍යක්ෂ වරයා ලෙස කටයුතු කිරීමයි.
3. වේදපාඨ ගායනා කිරීමයි.
4. යාගය සිදු කිරීමයි.
5. යාගය සඳහා අවශ්‍ය පරිසරය සකස් කිරීමයි.

(05) බ්‍රාහ්මණ පූජකවරු විසින් සමාජය තුළ තම ප්‍රභුත්වය තහවුරු කර ගැනීම සඳහා විවිධ ඉගැන්වීම් ඉදිරිපත් කරන ලදී. ආශ්‍රම ධර්ම ද ඒ අතර විය. ආශ්‍රම ධර්ම තුළ අන්තර්ගත කරනු ලැබුවේ,

1. පූජකවරු සතු කරගන්නා ලද ආගමික කාර්ය භාරයයි.
2. පුද්ගල ජීවිතයක් අවධිවලට බෙදා එක් එක් අවධිවල දී කළ යුතු කාර්ය භාරයයි.
3. බ්‍රහ්ම සහව්‍යතාවය පතා බමුණු පූජකවරු විසින් කළ යුතු වූ කාර්ය භාරයයි.
4. උපනිෂද් යුගයේ දී මුනිවරු විසින් අනුගමනය කළ යුතු වූ කාර්යභාරයයි.
5. කිසියම් ආපදා අවස්ථාවක දී ආර්ය සාමාජිකයන් විසින් අනුගමනය කළ යුතු කාර්ය භාරයයි.

(06) රජවරුන් විසින් සිදුකරන ලද මහායාගයන් පිළිබඳව ද බ්‍රාහ්මණ ග්‍රන්ථවල තොරතුරු සඳහන් වේ. ''රාජසූය'' යාගය ද ඒ අතර විය. එම යාගයෙන් අදහස් කරන්නේ,

1. වටිනා අශ්වයන් බිලිදීමයි.
2. යාගස්ථම්භය ගවලෙයින් පිදීමයි.
3. රජවරු අභිෂේක කිරීමයි.
4. මද්‍යපාන වර්ග සහිත යාග කිරීමයි.
5. කුලහීන පිරිමින් බිලිදීමයි.

(07) සමාජ වර්ගීකරණය තුළ සිවුකුලයක් ඇති කළේ මහා බ්‍රහ්මයා විසින් ය යන මතය ප්‍රතික්ෂේප කරන බුදු සමය එය සිදු වූයේ ඓතිහාසික සාධක අනුව සමාජමය අවශ්‍යතා පදනම් කරගෙන බව සඳහන් කරයි. ඒ බව තේරුම් කර ගැනීම සඳහා අධ්‍යයනය කළ යුත්තේ,

1. මජ්ඣිම නිකායේ අස්සලායන සූත්‍රයයි.
2. දීඝනිකායේ මහා පරිනිබ්බාන සූත්‍රයයි.
3. මජ්ඣිම නිකායේ වාසෙට්ඨ සූත්‍රයයි.
4. අංගුත්තර නිකායේ කාලාම සූත්‍රයයි.
5. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයයි.

(08) බුද්ධ කාලීන භාරතයෙහි ශ්‍රමණ සංස්කෘතිය පිළිබඳව කරුණු ගවේෂණය කරන විට බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදාය තුළ දැකිය නොහැකි ලක්ෂණයක් වනුයේ,

1. පිණ්ඩපාතයෙන් යැපෙන සරල දිවිපෙවෙතක් ගත කරන පිරිසකි.
2. අත්ත කිලමථානුයෝගයෙන් ඉඳුරන් දමනය කිරීම සඳහා උත්සුක වූ පිරිසකි.
3. පුද්ගල ස්වාමිත්වය අගය කරමින් ප්‍රතිපත්ති පුරන ලද පිරිසකි.
4. බ්‍රහ්මචර්යාව අනුගමනය කරමින් අනගාරික ප්‍රතිපදාව අගය කළ පිරිසකි.
5. සන්සුන් ඉඳුරන් ඇතිව අභ්‍යන්තර හා බාහිර පාරිශුද්ධිය වෙනුවෙන් ක්‍රියා කළ පිරිසකි.

(09) උත්සාහය, වීර්ය, අධිෂ්ඨානය, පුරුෂ බලය, පුරුෂ පරාක්‍රමය, ප්‍රතික්ෂේපකරමින් සියලු සත්ත්වයන් සියලු ප්‍රාණීන් වීර්ය රහිත, බලරහිත, ස්වකැමැත්තට අනුව කටයුතු කළ නොහැකි පිරිසක් ලෙස හඳුන්වා දෙමින් සත්ත්වයාගේ කෙලෙසීමට හෝ විශුද්ධියට හේතු ප්‍රත්‍යයක් නැතැයි ද දක්වමින්, අහේතු අප්‍රත්‍යවාදයක් සමාජය තුළ ව්‍යාප්ත කිරීමට උත්සාහ කළ ශාස්තෘවරයකු වූයේ,

1. අජිතකේස කම්බලිය.
2. පූර්ණ කස්සපය.
3. මක්ඛලී ගෝසාලය
4. පකුධ කච්චායනය.
5. සංජය බෙල්ලට්ඨී පුත්තය.

(10) සොළොස් මහා ජනපද අතර පැවති විවිධ ක්‍රමෝපායන අතර ''මත්ස්‍ය'' න්‍යාය ද දැකිය හැකිය. එය අනුගමනය කරන ලද බවට පැහැදිලි සාධක දැකිය හැකි රාජ්‍යයන් දෙකක් ඇතුළත් වරණය වන්නේ,

1. වජ්ජි, මල්ල, කාසි, කුරු.
2. අංග, මගධ, සුරසේන, අස්සක
3. පංචාල, ගන්ධාර, කෝසල, චේති
4. මගධ, කෝසල, අස්සක, සුරසේන
5. අවන්ති, ගන්ධාර, කාම්බෝජ, පංචාල

(11) කොසඹෑනුවර අගනගරය බවට පත් කර ගනිමින්, උපක්‍රමශීලීව බලය තහවුරු කර ගැනීමට ක්‍රියා කළ පාලකයෙක් සිටි රාජ්‍යය ලෙස සඳහන් කළ හැක්කේ,

1. අවන්ති රාජ්‍යයයි
2. වත්ස රාජ්‍යයයි.
3. වජ්ජි රාජ්‍යයයි.
4. මල්ල රාජ්‍යයයි
5. කෝසල රාජ්‍යයයි.

(12) මිය ගිය තම ස්වාමි පුරුෂයා වෙනුවෙන් බිරිඳක විසින් කළ යුතු උසස්ම ගෞරවනීය චාරිත්‍රයක් ලෙස බමුණන් විසින් හඳුන්වා දෙන ලද්දේ,

1. දරුවන්ගේ ආරක්ෂාව සහතික කරමින් ජීවත් වීමයි.
2. ස්වාමියාගේ ඥාතීන් සමඟ සුහදසීලීව කටයුතු කිරීමය.
3. ත්‍රිලක්ෂණය මෙනෙහි කරමින් භාවනා කිරීමයි.
4. සති ප්‍රඥාව නමින් හැඳින් වූ කටයුත්තෙහි යෙදීමයි.
5. ගෘහ ජීවිතය අතහැර වනගත වීමයි.

(13) ''උදේන'' රජු තෙරුවන් සරණ ගියේ,

1. මහා කාශ්‍යප තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.
2. මහා කච්චාන තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.
3. පිණ්ඩෝල භාරද්වාජ තෙරුන් වහන්සේගේ ධර්මය ඇසීමෙනි.
4. ආනන්ද තෙරුන් වහන්සේගේ ධර්මය ඇසීමෙනි.
5. මුගලන් තෙරුන් වහන්සේගේ ධර්මය ඇසීමෙනි.

(14) දත යුතු සියල්ල අවබෝධ කළ බැවින් ද චතුරාර්ය සත්‍යය තමන් වහන්සේම අවබෝධ කොට අන්‍යයන්ට අවබෝධ කරවන හෙයින් ද බුදු රජාණන් වහන්සේ සතු වූ ගුණය හඳුන්වන්නේ,

1. බුද්ධ නමිනි.
2. අරහං නමිනි.
3. භගවා නමිනි.
4. සුගත නමිනි.
5. ලෝක විදූ නමිනි.

(15) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණ යන ත්‍රිවිධ බලය එක් අයෙකු වටා පැවතියත්, යුවරජු සේනාධිපති පුරෝහිත, අධිකරණනායකන්, යනාදීන්ගේ සහාය ලබාගත් බුද්ධකාලීන පාලන ක්‍රමය වූයේ,

1. ගණතන්ත්‍ර පාලන ක්‍රමයයි.
2. රාජාණ්ඩු පාලන ක්‍රමයයි
3. වජ්ජි සමූහාණ්ඩු පාලන ක්‍රමයයි
4. සමූහාණ්ඩු පාලන ක්‍රමයයි.
5. ලිච්ඡවී පාලන ක්‍රමයයි.

(16) ''සතර බ්‍රහ්ම'' විහරණයන් අනුපිළිවෙලින් සඳහන් කරන්නේ,

1. මෙත්තා, මුදිතා, කරුණා, උපෙක්ඛා යනුවෙනි.
2. මෙත්තා, උපෙක්ඛා, කරුණා, මුදිතා යනුවෙනි.
3. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛා යනුවෙනි.
4. කරුණා, මුදිතා, මෙත්තා, උපෙක්ඛා යනුවෙනි.
5. මුදිතා, කරුණා, මෙත්තා, උපෙක්ඛා යනුවෙනි.

(17) බුදු රජාණන් වහන්සේ සතුව ත්‍රිවිද්‍යා ඥානය, අෂ්ට විද්‍යාඥානය, සර්වඥතා ඥානය ආදී වශයෙන් විවිධ වූ ඥානයන් පැවති බව සඳහන් වේ. එමඟින් පෙන්නුම් කරන්නේ උන්වහන්සේගේ,

1. විශිෂ්ට ශාස්තෘත්වයයි.
2. මහා කරුණා ගුණයයි.
3. ආදර්ශවත් නායකත්වයයි.
4. මහා ප්‍රඥාවේ ප්‍රබලත්වයයි.
5. මෛත්‍රී සහගත සිතුවිලිය.

(18) විශිෂ්ට ශාස්තෘවරයකු ලෙස දෙවි මිනිසුන්ට පිහිට වූ බුදුරජාණන් වහන්සේ ධර්ම දේශනාවල දී විවිධ ක්‍රම යොදා ගනු ලැබීය. ඒ අනුව ''අට්ඨුප්පත්තික'' දේශනා ක්‍රමය ලෙස හඳුන්වා ඇත්තේ,

1. ශ්‍රාවකයන්ගේ අපේක්ෂාව අනුව දහම් දෙසීමයි.
2. තමන් වහන්සේගේ අදහසට අනුව ධර්මය දේශනා කිරීමයි.
3. ප්‍රශ්නයකට පිළිතුරු දීම වශයෙන් දහම් දේශනා කිරීමයි.
4. ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමයි.
5. අර්ථය පැහැදිලි කිරීම සඳහා දහම් දේශනා කිරීමයි.

(19) ''නූතන විද්‍යාත්මක චින්තනයට පිළිගත හැකි ආගමක් වේ නම් ඒ බුදු දහමයි'' යනුවෙන් ප්‍රකාශ කළ නූතන විද්වතකු වන්නේ,

1. මැක්ස්මුලර්ය.
2. ලක්ෂ්මිනරසුය.
3. බර්ට්‍රන්ඩ් රසල්ය.
4. සෝණ්ඩර්ස් ය
5. ඇල්බට් අයින්ස්ටයින්ය.

(20) භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා යන සිවුවනක් පිරිසටම සුදුසුකම් මත තනතුරු පිරිනැමීම බුදුරදුන් තුළ පැවති බොහෝ දෙනාගේ ප්‍රසංසාවට ලක් වූ ක්‍රියා පිළිවෙතකි. ඒ අනුව ධර්ම කථික උපාසකයන් අතර අග්‍රස්ථානයට පත්වූයේ,

1. බරණැස් සිටුතුමාය.
2. බිම්බිසාර රජතුමාය.
3. ඉසිදත්ත උපාසක තුමාය.
4. චිත්තගහපති උපාසකතුමාය.
5. අනාථ පිණ්ඩික උපාසකතුමාය.

(21) සංහිඳියාගම එක්සත් මිතුරු සංසදයේ සාමාජිකයන් පුරුද්දක් ලෙස, නිතර ගමේ ප්‍රජා ශාලාවට රැස්විය. ගමේ සංවර්ධනය පිළිබඳ දිගුවේලාවක් සාකච්ඡා කරන ඔවුන් ඉතා සමගියෙන් විසිර යන්නේ, නැවත හමුවීමේ අපේක්ෂාවෙනි. ගමේ සිටින වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා පිළිගත් ඔවුන් ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේට විශේෂයෙන් ගෞරව කළේ ය. මෙම මිතුරන්ගේ ක්‍රියාකාරකම් තුළින් පැහැදිලි වන්නේ,

1. ඔවුන් බෞද්ධයන් බවයි.
2. ඔවුන් පංචසීලය ආරක්ෂා කළ පිරිසක් බවයි.
3. ඔවුන් ආගමික සංහිඳියාව අගයන පිරිසක් බවයි.
4. ඔවුන් ලෝකපාලක ධර්ම අනුගමනය කළ බවයි.
5. අපරිහානිය ධර්ම අගයන පිරිසක් බවයි.

(22) බුදුරජාණන් වහන්සේ විසින් විවිධ හේතු සාධක පදනම් කරගෙන භික්ෂූන් වහන්සේලාට විනය නීති පනවන ලදී. එසේ විනය නීති පැන වීම ආරම්භ කළේ බුද්ධත්වයෙන්,

1. වසර දහයක් ගත වූ පසුවය.
2. වසර දහසයක් ගත වූ පසුවය.
3. වසර විස්සක් ගත වූ පසුවය.
4. වසර විසි පහක් ගත වූ පසුවය.
5. වසර විසි නවයක් ගත වූ පසුවය.

(23) ජනහිත කාමී ධාර්මික රාජ්‍ය පාලනයක් උදෙසා රට තුළ අපරාධ මැඩලිය යුතුය. පරිසරය රැක ගැනීමත් පක්ෂි සිවුපා ආදී සත්වයන් රැක ගැනීමත්, දිළිඳු ජනයා නඟා සිටුවීම සඳහා කටයුතු කිරීමත් ඉතා වැදගත් වේ. මෙකී කරුණු ද අන්තර් ගත වූ බෞද්ධ දේශපාලන ප්‍රතිපත්තිය හඳුන්වන්නේ,

1. සතර සංග්‍රහවස්තු නමිනි
2. පංචසීල ප්‍රතිපත්තිය නමිනි
3. අෂ්ටාංග සීලය නමිනි
4. දස රාජධර්මය නමිනි
5. දස සක්විතිවත් නමිනි

(24) මිනිසාගේ විශේෂත්වයන් පිළිබඳව බුදු දහම සඳහන් කරන කරුණු විමර්ශනය කරන විට අන්තකාර, පරකාර ආරම්භධාතු, නික්ඛම ධාතු, පරක්කම ධාතු, ඨිතිධාතු, උපක්කමධාතු ආදී පද රැසක් හමුවෙයි. මෙම පදවලින් අවධාරණය කරන්නේ,

1. පුද්ගල ශක්තිය පිළිබඳවයි.
2. පුද්ගල සීලය පිළිබඳවයි.
3. පුද්ගල වේමත්තතාවය පිළිබඳවයි.
4. පුද්ගල යුතුකම් පිළිබඳවයි.
5. පුද්ගල චරිත ලක්ෂණ පිළිබඳවයි.

(25) රටෙහි පාලකයා සියලුම රට වැසියන් විෂයෙහි තම දරුවන් යන හැඟීමෙන් යුතුව එක සමානව කටයුතු කරන්නේ නම් ඔහු තුළින් ප්‍රකට වන්නේ,

1. ජනතාව හා මිත්‍රශීලි පාලකයකු බවයි.
2. පරිත්‍යාගශීලි බව උපරිමයෙන් අනුගමනය කරන බවයි.
3. ජනතාමත සියල්ලටම සවන් දෙන බවයි.
4. සමානාත්මතාවය අනුගමනය කරන බවයි.
5. වැඩි දෙනාගේ කැමැත්ත අනුව ක්‍රියාකරන්නකු බවයි.

(26) යහපත් සමාජ සබඳතා පුද්ගල හා සමාජ සංවර්ධනයට හේතුවෙයි. ඒ සඳහා මගපෙන්වන සිගාලෝවාද සූත්‍රයෙහි යෝජනා කරන ලද සමාජ කණ්ඩායම් ගණන,

1. පහකි.
2. හයකි.
3. දහයකි.
4. දහසයකි
5. විසිහතරකි.

(27) බුදු දහමේ සඳහන් යුතුකම් හා වගකීම් අතර ශිල්ප ලබා දීමත්, නොදත්දේ කියා දීමත් යුතුකම් සේ සලකන්නේ,

1. ගුරුවරුන්ගේ හා මිතුරන්ගේ ය.
2. දෙමාපියන්ගේ හා ස්වාමියාගේ ය.
3. දෙමාපියන්ගේ හා පැවිද්දන්ගේ ය.
4. ගුරුවරුන්ගේ හා දෙමාපියන්ගේ ය.
5. ස්වාමියාගේ හා බිරිඳගේ ය.

(28) මහා නිදාන සූත්‍රය ශ්‍රවණය කිරීමෙන් සෝවාන් ඵලයට පත් වූයේ,

1. ඛේමා බිසවයි.
2. උප්පලවණ්ණා දේවියයි.
3. සාමාවතී බිසවයි.
4. විශාඛා මහෝපාසිකාවයි
5. නකුල මාතාවයි.

(29) බෞද්ධ මූලාශ්‍රවල සඳහන් පරිදි සිල් ආරක්ෂා කිරීමෙන් දිව්‍ය සම්පත්, මනුෂ්‍ය සම්පත්, නිවන් සම්පත් ලැබිය හැකිය. සිල් ආරක්ෂා කිරීමෙන් ලැබෙන. විශේෂ ආනිශංස පහක් පිළිබඳව ද සඳහන් වන අතර එයට අයත් නොවන්නකි,

1. මහත් වූ භෝග සම්පත් ලැබීම.
2. සිරුර පැහැපත් වීම.
3. කීර්තිය පැතිරීම.
4. සිහිමුලා නොවී කලුරිය කිරීම.
5. ඕනෑම පිරිසක් මැදට නිර්භයව යා හැකි වීම

(30) කෙනකුගේ දියුණුව දැක සතුටු විය හැකි නම් එය උසස් ගුණාංගයකි. එම ගුණය බුදු දහමෙහි හඳුන්වන්නේ,

1. ඍජු ගුණය නමිනි.
2. කරුණා ගුණය නමිනි.
3. අප්පිච්ඡතා ගුණය නමිනි.
4. මුදිතා ගුණය නමිනි.
5. තාදී ගුණය නමිනි.

(31) සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ විග්‍රහය අනුව පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත්ම නිවැරදි ප්‍රකාශය විය යුත්තේ,

1. පාරිසරික සාධකවල බලපෑමෙන් එය සිදු විය.
2. මනෝ විද්‍යාත්මක සාධක පමණක් ඒ සඳහා බලපෑවේය.
3. පටිච්චසමුප්පාද මූලධර්මයට අනුව පාරිසරික මෙන්ම මනෝවිද්‍යාත්මක සාධක ද බලපෑමෙන් එය සිදු වී ඇත.
4. පාරිසරික සාධක වෙනස් වූයේ සර්ව බලධාරී දේවියකුගේ මෙහෙය වීමක් සිදු වූ නිසාය.
5. මිනිස් ක්‍රියාකාරකම් සිදු වූයේ අදෘශ්‍යමාන බලපෑම් අනුවයි.

(32) බුදුරජාණන් වහන්සේට විවිධ විනය නීති පැනවීමට සිදුවූයේ ඇතැම් භික්ෂු භික්ෂුණීන් අතින් සිදු වූ ශාසන විරෝධී ක්‍රියාකාරකම් නිසාය. ධර්මඥානයෙන් පිරිපුන් උපාසකවරයෙක් වූ චිත්ත ගෘහපතිතුමාට ගරහන ලද භික්ෂුවකට ද එසේ විනය නීතියක් පැනවීමට බුදුරදුන්ට සිදුවිය. එම සිදුවීම මුල්කරගෙන පටිසාරණීය කර්මය නම් දණ්ඩනයට ලක් වූ භික්ෂුව වූයේ,

1. සංඝමිත්ත භික්ෂුවයි.
2. සුදින්න භික්ෂුවයි
3. උදායී භික්ෂුවයි.
4. සුධම්ම භික්ෂුවයි.
5. සුදේව භික්ෂුවයි.

(33) කෙලෙස්වලින් ආතුර වූ සමාජයේ අනාතුරව සිටීමත් වෛර කරන්නන් අතර අවෛරීව සිටීමත් බුද්ධ චරිතය තුළින් මනා ලෙස ප්‍රකට විය. එමගින් පෙන්නුම් කරන්නේ,

1. තාදි ගුණයයි.
2. මහා කාරුණික බවයි.
3. අසරණ සරණ ගුණයයි.
4. නිදහස් චින්තනයයි.
5. පද්මාකාර ජීවිතයයි.

(34) ආගමික සහනශීලිත්වය අගය කරන බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ යමක් පිළිගත යුත්තේ ප්‍රකාශ කරන්නාගේ වැදගත්කම නිලය බලය උගත්කම ගැන සලකා බලා නොව එම කරුණෙහි නිරවද්‍යතාව සලකා බලා නුවණින් විමසා බැලීමෙන් පසුව බවයි. මෙම අදහස ඇතුළත් කරමින් දේශනා කරන ලද සතර මහාපදේශයන්ට අයත් නොවන්නේ,

1. බුද්ධෝපදේශ.
2. ධම්මෝපදේශ.
3. සංඝෝපදේශ.
4. සම්බහුලත්ථේරාපදේශ.
5. ඒකථේරාපදේශ.

(35) බොහෝ අන්‍යාගමික පිරිස් බුදු රජාණන් වහන්සේ හා තර්ක විතර්ක කිරීමට පවා පැමිණියේය. එහෙත් පසුව ඔවුන් අරමුණු වෙනස්කරගෙන බුදුරදුන් කෙරෙහි පැහැදීමට යොමු විය. එසේ පැමිණි එක් පුද්ගලයෙක් පුදුමයට පත්ව ප්‍රකාශ කළේ, භාග්‍යවතුන් වහන්ස, ඔබ වහන්සේ අන්‍යයන් අසන ප්‍රශ්නවලට කල්තියා පිළිතුරු සුදානම් කරගෙන සිටීද? ඔබ වහන්සේගේ විසිතුරු වූ ප්‍රශ්න විසඳීමේ ක්‍රමයට මා සිත් ඇදී ගියෙමි.'' යනුවෙනි. එම ප්‍රකාශය කළ තැනැත්තා නම්,

1. අභය රාජ කුමාරයාය.
2. සෝණදණ්ඩ බමුණාය.
3. උපාලි ගෘහපතියාය.
4. අක්කෝසක බමුණාය.
5. සකුළුදායී පිරිවැජියාය.

(36) පුද්ගල චරිත ලක්ෂණ පුද්ගල මානසිකත්වය, මෙන්ම පුද්ගල ගැටලු ද මැනවින් තේරුම් ගත් බුදුරජාණන් වහන්සේ දහම් කරුණු අවබෝධ කරවීම සඳහා විවිධ උපක්‍රම යොදාගෙන ඇත. ඒ අතර උපමානුසාරී දේශනා ක්‍රමය හා පැවරුම් ක්‍රමය යොදා ගත් බවට නිදසුන් ලෙස දැක්විය හැක්කේ,

1. කිසාගෝතමියට හා අක්කෝසක බමුණාට මග පෙන්වීමයි.
2. නකුල මාතාට හා ඡන්නහිමියන්ට මගපෙන්වීමයි.
3. රාහුල හිමියන්ට හා චුල්ල පන්ථක හිමියන්ට මග පෙන්වීමයි.
4. චුල්ලපන්තක හිමියන්ට හා ආනන්ද හිමියන්ට මග පෙන්වීමයි.
5. මල්ලිකා දේවියට හා විශාඛා මහෝපාසිකාවට මග පෙන්වීමයි.

The National e-learning Portal for General Education

(37) කාන්තා සමාජයට උසස් වටිනාකමක් ලබාදීමට කටයුතු කළ බුදු සමය කෝසල සංයුක්තයේ ධීතු සූත්‍රයේ දී භාර්යාව සතු විය යුතු උතුම් ලක්ෂණ පහක් සඳහන් කර ඇත. එහි ''වරාංගනා'' යන්නෙන් අදහස් වන්නේ,

1. සිය සැමියාට ගරුසරුව පුදන තැනැත්තියයි.
2. නෑයන් සතුටු කරන තැනැත්තියයි.
3. ජනයාගේ සිත් පහදවන තැනැත්තියයි.
4. සීලාදී ගුණ ධර්ම ආරක්ෂා කරන තැනැත්තියයි.
5. කාන්තාවන්ට උතුම් වූ තැනැත්තියයි.

(38) බුද්ධ කාලීන උපාසිකා සමාජය තුළ ප්‍රණීත ආහාර දෑ දෙන්නියන් අතර අග්‍ර වූයේ,

1. නකුලමාතා උපාසිකාවයි.
2. ඛුජ්ජුත්තරා උපාසිකාවයි.
3. විශාඛා උපාසිකාවයි.
4. සුප්පාවාසා උපාසිකාවයි.
5. සාමාවතී උපාසිකාවයි.

(39) බෞද්ධ ඉගැන්වීම් අතර සමාජය තුළ යහපැවැත්ම ඇති කිරීමට බොහෝ කරුණු ඉදිරිපත් කරයි. ඒ අතර ''රියසකට කඩ ඇණය'' මෙන් සමාජයේ යහපැවැත්මට උපයෝගී වන කරුණු ඇතුළත් කරන්නේ,

1. සතර බ්‍රහ්ම විහරණ තුළයි.
2. සතර සංග්‍රහ වස්තුව තුළයි.
3. සතර ඍද්ධිපාද තුළයි.
4. චතුරාර්ය සත්‍යය තුළයි.
5. සතර අගති විරතිය තුළයි.

(40) රටක සමාජ සුභ සාධනය ඇතුළු පාලන තන්ත්‍රයේ යාන්ත්‍රණය ක්‍රියාත්මක වන්නේ ජනතාවගෙන් එකතු කරන බදු මුදල්වලිනි. එබැවින් නිසි පරිදි බදු ගෙවීම ජනතාවගේ ද යුතුකමක් බව අවධාරණය කරන්නේ,

1. අග්ගඤ්ඤසූත්‍රයේ ය.
2. කාලාම සූත්‍රයේ ය.
3. කරණීය මෙත්ත සූත්‍රයේය.
4. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ය
5. මහා මංගල සූත්‍රයේ ය

(41) පුද්ගල ස්වාමීත්වය, ස්වාධීනත්වය අගය කිරීමේ දී වඩාත් වැදගත් ඉගැන්වීමක් ලෙස දැක්විය හැක්කේ,

1. නියතිවාදයයි.
2. හේතුඵලවාදයයි.
3. අධිච්චසමුප්පන්නවාදයයි.
4. පුබාබේ කතහේතුවාදයයි.
5. අකිරිය වාදයයි.

(42) බුදුරජාණන් වහන්සේ සතු වූ සුවිශේෂී ඥානයන් විමර්ශනය කිරීමේ දී අෂ්ට විද්‍යාවන් පිළිබඳව ද තොරතුරු අනාවරණය වෙයි. ඒ අනුව ''නාමරූප ධර්මයන් හා ඒවායේ අනිත්‍යාදී ලක්ෂණ අවබෝධ කර ගන්නා ඥානය'' හඳුන්වන්නේ,

1. මනෝමය ඉද්ධි ඥානය නමිනි.
2. ඉද්ධිවිධ ඥානය.
3. විපස්සනා ඥානය නමිනි.
4. දිබ්බ සෝක ඥානය නමිනි.
5. දිබ්බ චක්ඛු ඥානය නමිනි.

(43) ''අධිපති ධර්ම'' ලෙස හඳුන්වා දී ඇත්තේ,

1. යහපාලනය පිළිබඳ සිද්ධාන්තයකි.
2. නිර්වානගාමී ප්‍රතිපදාව පිළිබඳ සිද්ධාන්තයකි.
3. ගෘහස්ත කළමනාකරණය පිළිබඳ සිද්ධාන්තයකි.
4. භික්ෂු සමාජයේ පාලනය පිළිබඳ සිද්ධාන්තයකි.
5. හොඳ නරක විනිශ්චය කිරීම පිළිබඳ සිද්ධාන්තයකි.

The National e-learning Portal for The General Education

(44) රාජ්‍ය පාලනයක යහපැවැත්ම සඳහා බුදුදහම මඟින් විවිධ කරුණු ඉදිරිපත් කර ඇත. එම කරුණු අතරින් රාජ්‍ය පාලකයා ''කළුවර අහසෙහි සඳමෙන්'' අනුක්‍රමයෙන් සැපසම්පත්වලින් පිරිහීමට හේතුවන්නේ,

1. සතර සංග්‍රහ වස්තු අනුගමනය නොකිරීමයි.
2. සතර අගතියෙන් අයතිගාමී වීමයි.
3. සතර බ්‍රහ්ම විහරණ අනුගමනය නොකිරීමයි.
4. ලෝක පාලක ධර්ම අනුගමනය නොකිරීමයි.
5. සතර කර්මක්ලේෂවලින් වෙන් වීමයි.

(45) බුදුදහම දඹදිව පුරා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීමේ දී රජවරුන්ගේ මෙන්ම සිටුවරු වැනි ධනවතුන්ගේද අනුග්‍රහය ලැබුණි. ඒ අනුව බෞද්ධ ආරාම ඉදිකිරීම ද සිදුවිය. කෝසල රාජ්‍යය තුළ පිහිටා තිබූ ආරාම තුනක් වන්නේ,

1. වේළුවනාරාමය, ජේතවනාරාමය, ඝෝෂිතාරාමය
2. ඝෝෂිතාරාමය, කුක්කුටාරාමය, බදරිකාරාමය
3. බදරිකාරාමය, වේළුවනාරාමය, ජේතවනාරාමය
4. ජේතවනාරාමය, රාජකාරාමය, පූර්වාරාමය
5. පූර්වාරාමය, ඝෝෂිකාරාමය, බදරිකාරාමය

(46) ශ්‍රමණ සම්ප්‍රදායට අයත් වූ ප්‍රසිද්ධ ශාස්තෘවරු සය දෙනෙකු පිළිබඳව දීඝනිකායේ සාමඤ්ඤඵල සූත්‍රයේ සඳහන්වේ. ඔවුන් අතරින් ක්‍රියවාදී දර්ශනයක් ඉදිරිපත් කළ ශාස්තෘවරයා වන්නේ,

1. පූර්ණ කස්සපය.
2. අජිත කේසකම්බලිය.
3. මක්ඛලි ගෝසාලය.
4. පකුධ කච්චායනය.
5. නිගණ්ඨ නාතපුත්තය.

(47) පුද්ගලයාගේ ශක්තිය ස්වාධීනත්වය අභයකරමින් ආගමික වශයෙන් සිතිමේ හා විමසීමේ නිදහස ද ලබා දුන් ශාස්තෘවරයෙක් ලෙස බුදු රජාණන් වහන්සේ ඇගයීමට ලක් කිරීමේ දී එය සනාථ කිරීමට නිදසුන් ලෙස ගත හැකි සූත්‍ර දේශනාවකි.

1. කාලාම සූත්‍රය.
2. චක්කවත්ති සීහනාද සූත්‍රය.
3. පබ්බජ්ජා සූත්‍රය.
4. පරිනිබ්බාන සූත්‍රය.
5. පත්තකම්මසූත්‍රය.

(48) ක්‍රිස්තු පූර්ව හයවන සියවසෙහි විවිධ ශ්‍රමණ ගුරුකුල පැවති අතර, අතින් දණ්ඩක් දරමින්, අන්තකිලමථානුයෝගීව උග්‍ර තපස්වුත අනුගමනය කළ ශ්‍රමණයන් හැඳින්වූයේ,

1. ආජීවක නමිනි.
2. ජටිල නමිනි.
3. තාපස නමිනි.
4. නිගණ්ඨ නමිනි.
5. පරිබ්‍රාජක නමිනි.

(49) මරණින් මතු සත්ත්වයාගේ සතර මහා භූත විශ්වයේ සතර මහා භූතවලට එකතු වන බවක් දානාදියෙන් යහපතක් නැති බවත් බාල පණ්ඩිත සියලු දෙනා මරණයෙන් විනාශයට පත්වන බවත් සඳහන් කරමින් උච්ඡේදවාදී මතයක් ඉදිරිපත් කළ ශාස්තෘවරයා වූයේ,

1. නිගණ්ඨනාත පුත්තය.
2. පූර්ණකස්සපය.
3. අජිත කේස කම්බලය.
4. සංජය බෙල්ලට්ඨිපුත්තය.
5. පකුධ කච්චායනාය.

(50) දිළිඳු බවින් රටෙහි ජනතාව මුදවා ගැනීම, ප්‍රජා සුභ සාධනය, ප්‍රජා අවශ්‍යතා සපුරාලීම, රටේ සංවර්ධනය ඇති කිරීම, පාලකයාගේ වගකීමකි. එය සපුරාලීම සඳහා රජු සතු විය යුතු ගුණ ධර්මය නම්,

1. සීලයයි.
2. පරිත්‍යාගයයි.
3. ඍජු බවයි.
4. දානයයි.
5. අවිහිංසාවයි.